


# බලෙන් බඳවා ගැනීම් නිසා සංවිධානය තුළ ගැටුම්

සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න

අනිවාර්ය පිරිස් බඳවා ගැනීමේ කටයුතුවල යොදවා සිටි කාන්තා සහ පිරිමි සටන්කාමීන්ට ජනතාව සමඟ වන ප්‍රවේශයෙන් පිළිබඳව බොහෝ දෙනෙක් පන්ති පැවැත්වූහ. එහෙත් යම් කිසි තරුණයෙක් හෝ තරුණියක් හෝ බලහත්කාරයෙන් සංවිධානයට බඳවා ගැනීම යනු කොපමණ දුෂ්කර සහ අයහපත් කාර්යයක්ද යන්න තේරුම් ගැනීමට සංවිධාන නායකත්වය අපොහොසත් විය. අනිවාර්ය පිරිස් බඳවා ගැනීම හේතුවෙන් සටන්කාමීන් අතරේ බොහෝ විවේචන සහ ගැටුම් ඇති විය. එම කාල වකවානුව තුළ වන්නියෙහි කොටි පාලනයේ සිරවී සිටි ජනයාගේ තත්ත්වය වචනයෙන් විස්තර කළ නොහැකිය. කුමන සමාජයක් ජීවත් කරවීම සඳහා අපි අරගලයට ගියෙමු ද, එම සමාජයේම පරිහානියට ද අපි හේතු ශාදක වූවෙමු. එයට මම ද දායක් වූ බව මහත් වූ වේදනාවෙන් සහ චිත්ත පීඩාවෙන් යුතුව මෙහිදී සටහන් කර සිටිමි. හැම සාමාජිකයෙකුගේ ම මානසික තත්වය එය බව මම දනිමි.

අනිවාර්ය පිරිස් බඳවා ගැනීම්වලින් බේරීම සඳහා සමාජයේ අඩු වයස් විවාහ වේගයෙන් වර්ධනය වන්නට විය. විවාහ නොවී පවා තරුණ ගැහුණු පිරිමි එකට ජීවත් වීමේ වාතාවරණය සමාජය තුළ අනුමත කෙරුණි. භූගත කුටි ඉදිකර තම දරුවන්ව මාස ගණනක් තිස්සේ ආරක්ෂා කළ යුතු තත්ත්වයට මවුපියෝ පත්වූහ. එමෙන්ම අනිවාර්ය බඳවා ගැනීම යටතේ බඳවා ගත් බොහෝ සටන්කාමීහු පසුව තම කැමැත්තෙන් විශිෂ්ට ලෙසින් කටයුතු කළ අවස්ථා ද විය. එමෙන්ම සටන් පෙරමුණේ දී ආයුධ විසිකර නිවෙස්වලට පලා ගිය අය ද, තවත් සමහරු අනිවාර්ය පදනමින් සටන් පෙරමුණට යවා මරණය වැළඳගත් අවස්ථා ද විය.

එම වකවානුව තුළ දේශපාලන අංශයෙහි සටන්කාමිකයෙකුව සිටීම මහත් මානසික බරක් ද අවමානයක් ද ඇති කරන්නක් විය. එතුවක් කල් ජනතාවගේ යහපතට කොටි සංවිධානය විසින් සිදුකරන ලද සියලුම වැඩ කටයුතු ජනතාවගේ සිත්වලින් අතුරුදහන් විය. කොටි සංවිධානයේ අනිවාර්ය පිරිස් බඳවා ගැනීම් මාර්ගයෙන් විමුක්ති අරගලය ජයග්‍රහණය කළ හැකියැයි මම කිසිසේත්ම නොසිතුවෙමි. ඇත්තෙන්ම මහත් දරුණු පරාජයක් කර ගමන් කරමින් සිටින බව මට දැනෙන්නට විය. එහෙත් නායකතුමාගේ අත්තනෝමතික ක්‍රියාකාරකම් හේතුවෙන් ජනතාවත්, සටන්කාමීනුත් මානසිකව පීඩාවට පත් වූ අතර දැරිය නොහැකි දුෂ්කර අත්දැකීම්වලට මුහුණ දීමට ද සිදුවිය.

මගේ ස්ථාවරය වූයේ නායකතුමා විසින් ගන්නා ලද ඉතාමත් වැරදි තීරණවලින් එකක් වන්නේ අනිවාර්ය බඳවා ගැනීම් යන්නයි. මෙම කාර්යයේ දී අදාළ සන්ධර්භයෙහි සිරකරුවන් වී බොහෝ සටන්කාමීහු සහ වගකීම් බාර අය සිතේ අකමැත්තෙන් යුතුව ක්‍රියාත්මක වූහ. පුදුකුඩුඉරිප්පු ප්‍රදේශයේ පැවැත්වූ රැස්වීමක දී ජ්‍යෙෂ්ඨ ප්‍රහාරක සෙන්පති කෙනෙකු වෙත මම ජනතාවගේ අදහස් ඉදිරිපත් කළෙමි. එවිට ඔහු මෙසේ පැවසුවේය.

"ඇයි තමිළිනී මේ විදිහට අවුල් කරන්නේ? නායකතුමා කියපු දෙය තමයි අපි කරන්නේ. ඔයාට බැරිනම් දාලා යන්ඩ. අනෙක් අයවත් අවුල් කරවන්නේ නැතුව."

ඊට පසුව ඇතිවූ සමහර සිත් බිඳීම්, එයින් ඇතිවූ මානසික ආතතිය හේතුවෙන් මා දිගටම උනන්දුවෙන් වැඩ කටයුතු ඉදිරියට කරගෙන යාම කළ නොහැකි දෙයක් බවට පත් වීය. දේශපාලන අංශ භාර තමිල් චෙල්වන් මට මෙසේ පැවසුවේය.

"තමිළිනී, ඔයා කාන්තාවන් සම්බන්ධ වැඩ කටයුතුවලට වැඩි අවධානයක් යොමු කරන්න. අනෙක් වැඩ කටයුතු බලාගන්න තව වගකීම් භාර කෙනෙක්ව පත් කරන්ඩ ඕනෑ කියන තීරණයට ඇවිල්ලා ඉන්නේ."

එම පුවත මට මහත් සැනසිලිදායක විය. කුමක්දෝ බරක් නැති වී මනස සහ ශරීරය සැහැල්ලු වූවාක් සේ විය. වගකීම් භාර තනතුරු දරමින් පරිපාලන කටයුතු නිසා මානසික පීඩාවට පත් වනවාට වඩා සටන්කාමියෙකු ලෙසින් කාන්තාවන් සඳහා වන කටයුතු සතුටින් කිරීම යහපත් ය යන අදහසට පැමිණියෙමි. දේශපාලන කාන්තා අංශය භාර තනතුරට ප්‍රහාරක බළඇණියට අයත් ජ්‍යෙෂ්ඨ සාමාජිකාවක් පත් කෙරුණි. මම මට ලැබුණු නිදහස නිසි අයුරින් ප්‍රයෝජනයට ගත යුතුය යන තීරණයට පැමිණියෙමි. මම වැඩි දින ගණනක් සටන් පෙරමුණේ සිටින කාන්තා බළඇණි සටන්කාමී සහෝදරියන් සමඟ ගත කළෙමි. සංවිධානයේ ප්‍රචාරක රැස්වීම් සඳහා වන ආරාධනාවන් ද දේශපාලන අංශයේ වැදගත් රැස්වීම් සඳහා වන ආරාධනාවන් ද පිළිගෙන සහභාගි වූවෙමි.

දුෂ්කර පරිපාලන කටයුතුවල බරින් පීඩනයට පත් වෙද්දී අපේ අරගලයේ මුළු ප්‍රමාණයම ගැන සිතා කටයුතු කරගැනීමට නොහැකිව සීමිත කටයුතු කීපයක් තුළ පමණක් එල්බ සිටීමට සිදුවන බව මම කාන්තා අංශය භාරව සිටි අවධියේදී මගේ අත්දැකීම්වලින් තේරුම් ගත්තෙමි. විමුක්ති කොටි සංවිධානය විමුක්ති සංවිධානයක් යන තත්ත්වයෙන් මිදී රාජ්‍ය යාන්ත්‍රණයක් ලෙසින් තමන්ව ප්‍රසාරණය කර ගත් නිසා සංවිධානයේ අධික බුද්ධිමය ශක්තිය පරිපාලන කටයුතුවලට තේරුමක් නොමැතිව වැය කිරීමට සිදුවිය. බොහෝ දක්ෂ සටන්කාමීන් වගකීම් භාර තනතුරුවලට පත් කර පරිපාලන ගැටලුවලට ඔවුන්ගේ කාලය හා දක්ෂතා වැය කිරීමට සිදුවන තත්ත්වයක් ඇති විය. එහෙත් එය සංවිධානයේ වර්ධනය ලෙසත්, ආඩම්බරයට කරුණක් ලෙසත් සලකන ලදි. සාම සාකච්ඡා පැවැති අවධියෙහි විදෙස් රටවල සිට පැමිණි අය පවා බොහෝ විට ඕමන්තෙන් මෙහාට උතුරේ වෙනම රටක් තමන් දුටු බව කියමින් උද්දාමයට පත් වූ බව මම දන්නෙමි.

මා සංවිධානයට බැඳුණු අවධියෙහි සිට විවෘතව කතා බහ කළ හැකි මිතුරියක ලෙසින් සෙන්පති විදූෂා මා සමඟ ආශ්‍රය කළාය. ඇය සංවිධානයේ ජ්‍යෙෂ්ඨත්වයෙහි සහ වගකීම් සහගත තත්ත්වයක සිටියත් කාන්තා අංශයෙහි වගකීම් දැරූ මා වැනි බොහෝ දෙනෙකුට ඇය යහපත් අවබෝධයකින් යුතු තැනැත්තියක් වූවාය. වඩමාරච්චියේ පිහිටි සප්පුදු නම් ග්‍රාමයෙහි උපන් ඇය හින්දු බ්‍රාහ්මණ පවුලක වැඩිමහලු දියණිය වූවාය. 'කුමුදුණී' යාත්‍රාවේ ගමන් කළ පිරිස් ඝාතනය කිරීමේ සිද්ධියෙන් ඇති වූ මානසික බලපෑම තමන් සංවිධානයට බැඳීමට හේතු වූ බව ඇය සඳහන් කළාය. තම ආරම්භක ක්‍රියාකාරකම් "සුදන්දිර පරවෛහල්" සංවිධානය තුළින් ආරම්භ කළ ඇය කිලාලි ප්‍රදේශයෙහි පිහිටුවා තිබූ විමුක්ති කොටින්ගේ දෙවන කඳවුරේ දී තම ආයුධ පුහුණුව ලැබුවාය. තමන් වෙත පවරන කාර්යභාරය ඉතාමත් මැනවින් කළ යුතුය යන ආකල්පය ඇය සතු විය.

ඉන්දීය හමුදාව පැමිණ සිටි කාලයේ දී විමුක්ති කොටි සංවිධානය වැලිඔය කැලෑව තුළ සැඟව උන්නේය. එවක ගබඩා භාරකරු තනතුර පවරා තිබුණේ විදූෂා වෙතය. එයට පසුව යාපනය කොටුවට ප්‍රහාර එල්ල කිරීම ආරම්භ වී දෙදහස් නවය වසරේ පුදුකුඩියිරුප්පුවෙහි ආනන්දපුරයෙහි දී මරණයට පත්වෙන තෙක් කාන්තා බලකාය සහභාගි වෙන සෑම ප්‍රහාරයකදීම ඇය වැදගත් භූමිකාවක් දැරුවාය.

ආරම්භයේ දී කාන්තා බළකායේ කුඩා ප්‍රහාරක බළඇණිවලට නායකත්වය දුන් ඇය ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වී සංවිධානයෙහි ප්‍රමුඛ අණ දෙන සෙන්පති තනතුරක් දක්වා පැමිණියා ය. 1993 දී කාන්තා බළකායේ දෙවන පෙළ සෙන්පති තනතුර දැරූ ඇය 1995ට පසුව මාලනී බළකායේ විශේෂ සෙන්පති බවට පත් කෙරුණු අතර මරණය දක්වාම එම තනතුර දැරුවාය. ඇයගේ මලණුවන් වූ විදූෂන් 1999 දී වවුනියාවේ විලක්කුනෙනකුලම් ප්‍රදේශයේ දී හමුදාව සමඟ ඇතිවූ ගැටුමක දී වීර මරණයට පත් වූයේය.

සෘජු ප්‍රහාරක ක්‍රියාන්විතවලට සම්බන්ධ වීමේ අවස්ථා බහුලව නොලැබුණ ද සටන් පෙරමුණේ ක්‍රියාකාරී සෙන්පති විදූෂාගේ අණ දෙන මධ්‍යස්ථානයට ගොස් ඇය සමඟ යුද පෙරමුණේ තත්ත්වය පිළිබඳව ඉඳහිට සාකච්ඡා කළෙමි. අවසන් යුද්ධ කාලයෙහි දී සෙන්පති විදූෂා මහත් සිත් කැළඹීමට පත්ව සිටින බව මට අවබෝධ කරගැනීමට හැකි විය. 2007 වසරේදී ඇයගේ මාලනී බළකාය මන්නාරම් ඉදිරි යුද්ධ පෙරමුණෙහි සිටියේය. මන්නාරම ප්‍රදේශයෙහි ක්‍රියාත්මක වෙමින් සිටි දේශපාලන අංශ සටන්කාමීන් හමුවීමට යන සෑම අවස්ථාවකම මම ඇයගේ අණ දෙන මධ්‍යස්ථානයට ද ගියෙමි. යුද පෙරමුණේ කටයුතු පිළිබඳවත්, මාලනී බළකායේ කටයුතු පිළිබඳවත්, සංවිධානයේ නායකතුමා සමඟ කෙලින්ම කතා කිරීමේ අවස්ථාව ඇය සතුවිය.

"සටන් පෙරමුණේ සැබෑ තත්ත්වය සහ ප්‍රායෝගික ප්‍රශ්න ගැන කවුරුවත් නායකතුමාට හරියට දැනුම් දෙන්නේ නෑ."

යන හිත් පීඩාව ඇය තුළ තිබුණි. නායකතුමා වෙත සටන් බිමේ තත්ත්වයද, සැබෑ ස්වාභාවය ද දැනුම් දිය යුතුය යන ආකල්පය සහිත වූ විදූෂා, නායකතුමා හමුවන අවස්ථාවල දී යුද්ධ පෙරමුණේ පවතින ප්‍රශ්න, සටන්කාමීන් මුහුණ දෙන ගැටළු ආදිය නායකතුමාට දැනුම් දෙන්නීය. පසුව නායකතුමා පිරිමි සෙන්පතිවරුන්ගෙන් ඒ පිළිබඳව කරුණු විමසා සිටින විට බොහෝ ජ්‍යෙෂ්ඨ සෙන්පතිවරුන්ට එය මහත් ගැටළු සහගත බවක් ඇති කිරීමට හේතු විය.

"සටන් පෙරමුණේ ඇතිවෙන ප්‍රශ්න අපි අපිම තමයි බේර ගන්න ඕනෑ. විදූෂා හැම එකක්ම ගිහින් නායකතුමාට කියලා නායකතුමා ටෙන්ෂන් එකේ ඉන්නේ. තව තවත් ටෙන්ෂන් ඇති කරන්ඩ හොඳ නෑ."
යැයි උපදෙස් දෙන ආකාරයෙන් ඔවුහු චෝදනා එල්ල කරති. මෙවැනි සිදුවීම් හේතුවෙන් විදූෂා මානසික වේදනාවෙන් සිටියාය.